# ජල පාලනය ඔප කරන ගොවි සංවිධාන

## නිලධාරී ගොවි සබඳතාවය ගොඩ නැගේ

ජල පාලන ව්‍යාපෘතියට පෙර ගල්ඔය නිම්නයේ කරන ලද සමීක්ෂණ වලදී එහි ගොවීන් සහ නිලධාරීන් අතර සම්බන්ධතාවය සහමුලින්ම වාගේ දුර්වල තත්ත්වයක පැවැති බව අනාවරණය වී තිබුණි. අම්පාර දිසාපති තුමාගේ විශේෂ උනන්දුව මත එගා කාල සටහනකට ගොවීන් හුරු පුරුදු කිරීමට ප්‍රයත්නයක් ගෙන තිබීම හැර ගොවි-නිලධාරි සම්බන්ධතාව යන් පිළිබිඹු කරන වෙනත් සාධක දැකීම අසීරු විය. කන්න රැස්වීම් තුලින් පැමිණි ගොවීන් හා නිල ධාරීන් මාස ගණනාවකට වරක් බැගින් මුණ ගැසීමට අවසථාව සැලසී තිබුනේය. එහෙත් ඉතාම දුර්වල සංනිවේදන ක්‍රමයක් යටතේ පැවැත්වුන කන්න රැස්වීම් වලදී සුහදභාවය හා අවිශ්‍යතාවය පදනම් කරගත් සාකච්ඡා මාර්ගයෙන් තීරණ වලට ඔවුහු වෙනුවට නිල ධාරීන් සහ ගොවීන් අන්‍යොන්‍ය වශයෙන් දෝෂාරෝපනය කර සිටීයේ ගාලගෝට්ටි කිරීම පොදු මෙන්ම සාමාන්‍ය ලක්ෂණය විය.


---

ආයතනික සංවිධායක
**ඩී. එස්. රණසිංහ**
විසිනි.

---

කන්න රැස්වීම් වලදී ඉතාම පැහැදිලිව පෙනුන දෙයක් නම් ගොවින් හා නිලධාරීන් අතර පමණක් නොව ගොවීන්-ගොවීන් අතරමත් කිසිම අයුරක සමගියක් සමාදනයක් හා සංවිධානාත්මක බවක් දක්නට නොමැති වීමයි.

ගොවීන් සහ නිලධාරින් ඒකාබද්ධව රැස්වෙන එකම අවස්ථාවවූ කන්න රැස්වීම වලට ආවේනිකව තිබුන එම දුර්වලකම් නිසා, කෘෂිකාර්මික කටයුතු වලදී ගොවීන් මුහුණ පා සිටි ප්‍රශ්ණ හා ගැටලු වලට එයින් පිහිටක් නොලැබුණි. මේ නිසා ගොවිතැන් කටයුතු වලට අදල ගැටලු ලියා ගැනීම සඳහා ගොවීන් පුරුදු පුහුණු වී සිටියේ ඉතා පහත් මට්ටමේ වෙනත් මාධ්‍යයක් උපයෝගි කර ගනිමිනි. ප්‍රශ්ණ විසඳන පොදු ක්‍රමයක් නොතිබුණ නිසා පෞද්ගලිකව එකිනෙකා ගෙන් වෙන් වී කටයුතු කිරීමට ගොවීන්ට සිදුවිනි. මේ වතාවරණය වඩාත්, ක්‍රමානුකූලව පොදු සේවයක් කිරීමේ අවශ්‍යතාවයක් තිබුන අවංක නිලධාරීන්



මෙබඳු වාරිමාර්ග පද්ධතියක ක්‍රියාකාරිත්වය: ජනතා සහභාගිත්වයන් ඔපවත් කළ හැකියි.

ට පවා ගොවීන්ගේ පෞද්ගලික හැසිරීම් රටාවෙන් ගොතන දැලට කොටුවෙනු විනා ඒ සීමාවෙන් පිටපැන යෑමට ඉඩක් නොලැබුනි. ඒ අනුව නිලධාරින් කෙරේ යොමු කෙරුනු විවෘතවූ හා විවෘත නොවූ දෝෂාරෝපන කිරීම් වලට අමතර ව පෙත්සම් ගැසීම් දේශපාලනඥයින්ගේ පිහිට පැතීම් අයථා උපක්‍රම යෙදීම්, ඉතාම සුලු ගැටලු වලදී පවා නිතියේ විවිධ පැතීම් වැඩි ගොවීන්ගේ බලාපොරොත්තු ඉටුකරන විසඳුම් මාර්ග ලෙසින් සැලකිල්ලට ලක් විය. මේ තුලින් නිලධාරින් හා ගොවින් අතර පැවතිය යුතු සමීප සම්බන්ධතාවය වෙනුවට ගොඩ නැගුනේ ඉතා දුරස්ථ සම්බන්ධතාවයකි. කාලයත් සමග මේ තත්ත්වය තව තවත් මෝරා ගිය අතර, විධිමත් සන්නිවේදන මාර්ගයක් නොමැති වීම නිසා නිලධාරීන් සතු කාර්ය භාරය කුමක්දැයි ගොවීන්ට අවබෝධයක් නැතිවීමත්, ගොවීන් මුහුණ පා සිටි සංකීර්ණ ප්‍රශ්ණ ගැන පුලුල් අවබෝධයක් නිලධාරින්ටද නැති වීමත් කැපී පෙනෙන ලක්ෂණයක් විය.

ගොවි-නිලධාරි සම්බන්ධතාවය ගිලිහී තිබුණ එම වාතාවරණය තුළ නිලධාරින් යනු ගොවීන් ගැන අබමල් රේනුවක් තරමින් වත් නොසලකන, සිමාර්තයම් පමණක් සලකන පිරිසක්ය'' යන වැරදි ආකල්පය ගොවි ජනතාව අතර තදින්ම තහවුරු වී තිබුණි. අනික් අතර ''ගොවින් යනු නිලධාරීන්ගේ වැරදි සෙවීමට දඟලන හිතුවක්කාර නුගත් සුහදකම නොහඳුනන කිසිම සමගියක් නැති පිරිසක්ය.'' යන වැරදි ආකල්පය නිලධාරින් අතර තහවුරු වී තිබුණි.

මෙම පසුබිම මත 1980 වසරේදී ගල්ඔය වාරිමාර්ග කටයුතු ප්‍රතිසංවිධානය කිරීම සඳහා වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක විනි. වාරිමාර්ග පද්ධතියේ භෞතික ප්‍රති සංවර්ධනයත් සමග ආයතනික රාමුවෙහි වෙනස්කම් රාශියක් සිදු කිරීම මෙම නව වැඩ පිළිවෙලට අයත් කාර්ය භාරයන් අතර විය. ජල පාලනය සඳහා ගොවීන් සංවිධානය කරමින් ගොවීන් හා නිලධාරීන් අතර අන්තයටම පිරිහී තුබුනු සම්බන්ධතාවය අලුතින්ම ගොඩ නැගීම ඉහත කී වාරිමාර්ග ප්‍රති සංවිධානාත්මක වැඩ පිළිවෙල සමග ක්‍රියාත්මක වූ ගොවි සංවිධාන ව්‍යාප්තියෙහි හටගත් වගකීම බව පෙන්වා දිය හැක.

මෙම දුෂ්කර කටයුත්ත සඳහා පහත දැක්වෙන පියවර දෙකක් සැලසුම් කිරීමට සිදුවිය.

1. ගොවීන් හා ගොවින් අතර සම්බන්ධතාවය ඇතිකිරීම.
2. ගොවීන් හා නිලධාරීන් අතර සම්බන්ධතාවය ඇති කිරීම.

මෙයින් අදහස් කරන ලද්දේ ගොවින් හා නිලධාරීන් අතර සම්බන්ධතාවය ගොඩ නැගීමට පෙර පූර්ව කොන්දේසියක් වශයෙන් ගොවින්, ගොවීන් අතර එකමුතුකමක්, සමගි සම්පන්න තාවයක් සහ සංවිධානාත්මක බවක් ගොඩ නැගී තිබිය යුතු බවයි.

ගොවීන් ගොවින් අතර සමගි සම්පන්න භාවයක් සහ සම්බන්ධිකරනයක් ඇති විමට සමාන්තරව, නිලධාරි සම්බන්ධතාවයද ඊට ඇතුලත් වනසේ ගොවි සංවිධාන වැඩ සටහන තුල ව්‍යුහයක් තිබිය යුතු විය. විධිමත් සම්බන්ධිකරණයක් ගොඩ නැගීම සඳහා ගොවි සංවිධාන වැඩ පිළිවෙලෙහි පහත දැක්වෙන අයුරු ස්ථාර කිහිපයක් සැලසුම් කරන ලදී.

1. කෙත් ඇල ගොවි කණ්ඩායම් සහ ක්ෂෙත්‍ර නිලධාරින්
2. බෙදුම් ඇල ගොවි සංවිධාන සහ ප්‍රාදේශීය (මැද මට්ටමේ) නිලධාරින්
3. ශාඛා ඇළ සංවිධාන
4. ප්‍රධාන ඇල සංවිධාන
5. ජලාශ මට්ටමේ සංවිධානය (සේනානායක සමුද්‍රය) සහ දිස්ත්‍රික් නිලධාරීන්

මුලින්ම ගොවීන් හත් අටදෙනා දහ පහළොස් දෙනා ඒකරාශිවන අන්දමින් කුඩා කුඩා කෙත් ඇල කණ්ඩායම් ගොඩ නැගීම තුලින් ගොවීන් ගොවීන් අතර සම්බන්ධිකරනයක් ඇති වීමට මග පෑදුනි. එසේ ගොඩ නැගුන ගොවි සම්බන්ධතාවය පදනම් කරගෙන ඇල නිලධාරීන්ගේ නැඹුරුවක් ඇති කිරීම ඊලඟ පියවර විය. විශේෂයෙන්ම මෙම මූලික අවස්ථාවේදී සම්බන්ධ කරගත යුතු වූයේ ක්ෂෙත්‍ර මට්ටමේ නිලධාරීන් වේ.

සැලසුම් කරන ලද ව්‍යුහය අනුව ගොවි සංවිධාන වැඩ සටහන ස්ථිරයෙන් ස්ථිරයව වේගයෙන් ඉදිරියට ගියේ නැත. එහෙත් කාලාන්තරයක් තිස්සේ කැකෑරෙමින් තිබුන ගොවි ප්‍රශ්න වලට විසඳුම් කෙත් ඇල ගොවි කණ්ඩායම් හා ක්ෂෙත්‍ර නිලධාරින්ගේ සම්බන්ධීකරණයෙන් පමණක් ලැබුනේද නැත. මේ නිසා මුලින් සැලසුම් කරන ලද ව්‍යුහයට වෙනස් අන්දමින් අලුත් උපාය මාර්ග නිර්මාණය විය.

මේ සඳහා උපයෝගි කරගන්නා ලද්දේ විධිමත් මාසික රැස්වීම් ක්‍රමයකි. ගල්ඔය ගොවි සංවිධාන වැඩ සටහන ක්‍රියාත්මක වන සම්පූර්ණ ක්ෂෙත්‍ර ප්‍රදේශ තුනක් වශයෙන් බෙද ගැනීම මෙහිදී සිදුවිය.

1, උහන

2. ගොනාගොල්ල

3. වීරගොඩ වශයෙන් බෙදුන එම ප්‍රදේශ වල වෙන් වෙන් වශයෙන් මාසික රැස්වීම් සංවිධානය වුන අතර එම රැස්වීම් වලට අදල ප්‍රදේශයේ සියලුම කෙත් ඇල කණ්ඩායම් වල නියෝජිතයින්

සහභාගී වේ. මෙහිදී කාලීන වශයෙන්, පැන නැගී ඇති අවස්ථා වේ වැදගත් කම ගැන සලකා ඊට අදාල අවශ්‍ය කෙරෙන නිලධාරින් ගේ සහභාගිත්වය ලබා ගැනේ. මෙම රැස්වීම් සංවිධානය කිරීම, ඊට අවශ්‍ය නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සහමුලින්ම කෙරෙනුයේ ප්‍රාදේශීය ගොවි සංවිධානය මගිනි. මෙම ප්‍ර දේශීය ගොවි සංවිධාන රැස්වීම් සඳහා මැද මට්ටමේ නිලධ රීන් මෙන්ම දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ද සහභාගිකර ගැනීම සිදුවේ.

විධිමත් රැස්වීම් ක්‍රමයකදී විසඳා ගැනීමට දුෂ්කර ක්ෂණික ගැටලු මතුවූ විට අතරමැදියෙකුගේ ආධාරයකින් තොරව, දිසාපති තුමා දන්නාවූ ඕනෑම නිලධාරියෙකු සමඟ සාකච්ඡා කිරීමට ගොවි සංවිධාන නියෝජිතයින්ට දූන් වරම් ලැබී තිබේ.


මීට අමතරව ඉ තා ම වැදගත් කාර්ය සංස්ද්වියක් ලෙස සැලකිය හැක්කේ අම්පාර දිසාපති තුමාගේ අනුග්‍රහය යටතේ දිස්ත්‍රික් කෘෂි කාර්මික කමිටුව තුල නියෝජන යන් ගොවි සංවිධාන වලට ලැබී තිබීමයි.

ඒ මගින් හුදෙක් නිලධාරින්ට පමණක් සීමා වී තිබුණ දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව තුල, ගොවීන් වෙනුවෙන් හඩක් නැගීමට තරම් ගල්ඔය නිම්නයේ ගොවීන් වාසනාවන්ත වීය.

මුලින් සැලසුම් කරන ලද ව්‍යුහයට වඩා ගොවි නිලධාරි සම්බන්ධය වෙනස් මගකට අවතීර්න ව මේ තරම් වේගයෙන් ඉදිරියට ගියේ විශේෂ හේතුන් කීපයක නිසාය, මින් මුලින්ම සඳහන් කළ හැක්කේ ගල්ඔය වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ සටහන වේ. ගලඔය ගොවි සංවිධාන වැඩ සටහන ප්‍රවේශයට සමකාලීන ගල්ඔය වාරිමාර්ග පුනරුත්ථාපන වැඩ සටහනද ක්‍රියාත්මක විය. මෙහිදී ආකල්ප වෙනස් කෙරෙමින් ක්‍රමානුකූලව හෙමින් සිරුවේ යන ගල් ඔය ගොවි සංවිධාන වැඩ සටහනේ ඉදිරිගමන, ගල්ඔය වාරිමාර්ග පුනරුත්ථාපන ක්‍රමයේ ඉදිරි ගමන හා සාමාන්තර නොවීය. මේ හැරුන විට ගොවි සංවිධාන වැඩ සටහනේ සංවිධානාත්මක අගය පිළිබඳව ගොඩනැගුන ප්‍රසාදය තුලින් ඊට ඉහළ මට්ටමින් අනුග්‍රගයක් ලැබී තිබේ.

ගල්ඔය නිම්නයේ සම්පූර්ණයෙන්ම මෙන් බිඳවැටී තිබුන නිලධාරි-ගොවි සම්බන්ධතාවය මේ අන්දමින් ඉහළ මට්ටමකට නංවා ගැනීම සඳහා උපයෝගි කර ගන්නා ලද්දේ ඉතාම සරල මාධ්‍යයෙනි.

එනම්, නීතිරීති, අනපනත්, රෙගුලාසි ආදියට යට නොවුන-එහෙත් ඒ වෙනුවට යොද ගත් සුහදතාවය පමණක් පදනම් කරගත් ''සාකච්ඡා'' ක්‍රමයකි. මෙම සුහද සාකච්ඡා ක්‍රමය ඉහළ ඵලදයී වූවා පමණක්නොව ගොවීන් තුල මෙන්ම නිලධාරීන් ත්ලද පැවති වැරදි ආකල්ප තුරන්කිරිමට තරම් ප්‍රබල විය. ආරම්භක අවධියේ අවධිමත්ව කෙරුන සුහද සාකච්ඡා ක්‍රමය කාලයක් සමග විධිමත් බවකට පත්වීම නිසා කාලාන්තරයක් තිස්සේ එකතැන පල් වෙමින් තිබුන සුලු සුලු ප්‍රශ්ණ රාශියක් කෙත් මට්ටමින් විසඳා ගැනීමට හැකිවිය. ඒ අනුව නිතිය පිටුපස්‌ දුවගෙන යනවාට වඩා සංවිධානාත්මකය මෙන්ම ක්‍රමානුකූල තමන්කේ ප්‍රශ්ණ නිලධාරීන්ට ඉදිරිපත් කිරිමෙන් ඉමහත් ප්‍රශස්ත විසඳුම් ලැබිය හැකිබව ගොවීන් දූන් අවබෝධ කරගෙන ඇත. ප්‍රශ්ණ අඩුවීම සහ තිබෙන ප්‍රශ්ණවල සංකීර්ණත්වය අඩුවීම තුලින් තමාගේ සේවා කටයුතු පවත්වා ගෙන යෑමට පහසුවත් සැලසෙනබව නිලධාරින්



විසින්ද අවබෝධ කරගෙන ඇත. මේ අයුරින් ගල්ඔය ගොවි සංවිධාන ව්‍යාපාරය විසින් ගොවී නිලධාරි දෙපක්ෂයේ සහභාගත්වය සහ ජල ප්‍රශ්ණ හා වෙනත් කෘෂි කාර්මික ගැටලු වඩාත් පහසුවෙන් සහ වඩාත් හොඳින් විසඳා ගැනීමට පුලුල් මාවතක් හෙලි පෙහෙලි කර තිබේ.

ජල පාලන හා වෙනත් කෘෂි කාර්මික ප්‍රශ්ණ හමුවේ භාවිතයට යොදගෙන ඇති මෙම විසඳුම් මාර්ගය පියවරවල් හතරකින් (4) යුක්තය. එම පියවර වල් හතරම ක්‍රියාත්මක වනුයේ ගොවි නිලධාරි දෙපක්ෂයේම සම්භාගිත්වය උපයෝගි කරගෙනය.

1. ගැටලුව නිවැරදිව හඳුනා ගැනීම.
2. විකල්පයන් අතුරින් වඩාත්ම ප්‍රසස්ත විසඳුම් සෙවීම.
3. තෝරාගත් විසඳුම ක්‍රියාත්මක කිරීම.
4. ක්‍රියාත්මක වූ විසඳුම් පිළිබඳ ඇගැයුම කිරීම.

ගොවි ගැටලු විසඳා ගැනීමේ මෙම පියවරවල් වල ප්‍රායෝගිකත්වය අඛණ්ඩව රැකගනු පිණිස යොද ගත හැකි උපාය මාර්ග විය ඇත්තේ විධිමත් රැස්වීම් ක්‍රමයකි. එම රැස්වීම් වලදී සුහද මට්ටමින් ගැගලු සාකච්ඡා කිරීම, තීරණ ගැනීම, තීරණ ක්‍රියාත්මක කිරීම හා තීරණ වල ක්‍රියාත්මක භාවය පිළිබඳ අගය කිරීම කෙරේ.

සාපේක්ෂව බලන විට ගල්ඔය ගොවි සංවිධාන ක්‍රමය තුලින් අලුත් නැඹුරුවන් සහ යහපත් ප්‍රවනතාවයක් ඇතිවී ඇති බව මේ අන්දමින් පෙනී ගියත් ක්‍රියාත්මක විමේදී යම් යම් දුර්වලතාවයන් දැකිය නොහැකිවාද නොවේ. ගල්ඔය ගොවි ජනපදය තුල වෙසෙන සංකීර්ණ සමාජ ආර්ථික පසු තලයක ජීවත්වන ගොවීන් පිරිසක් එක්වර එකම අන්දමින් සාමූහික ප්‍රයත්නයකට නැඹුරු කිරීම ලෙහෙසි පහසු කාර්ය භාරයක් නොවනු ඇත. අනිත් අතට නිලධාරින්ගේ පැත්තෙන් සැලකූ විටද ඉතාම මානව හිතවාදි කෙනෙකුට වුවද අවබෝධය තුලින් ආකල්පමය වෙනසක් ඇති වුවත්, නීතිරීති චක්‍ර ලේඛන නියෝග ආදියෙන් කොටුවී ඇති ඔහුගේ රාජකාරි සීමාවන් ඉක්මවා කටයුතු කිරීමේ හැකියාවක් නැත. කෙසේ වුවද නොනවත්නා ගමනක ආරම්භය පැහැදිලිව පෙනෙන්නට තිබේ. ගමන් ආරම්භ කල මාවත දුෂ්කර එකකි. කාලයක් සමඟ එම මාවත වඩාත් යහපත් ඒකත් විය හැකිය. ඊට ප්‍රධාන හේතුව වී ඇත්තේ ගොවි සංවිධාන ක්‍රමය තුලින්—ඒ සඳහා අනුග්‍රහය දක්වමින් කටයුතු කරන ගොවීන්ට මෙන්ම නිලධාරින්ටද හොඳක් මිස නරකක්, වී නොමැති බැවිනි. ගොවි සංවිධාන ක්‍රමය බිහි වූවාට පසු ගොවීන්ට ප්‍රතිලාභත් නිලධාරින්ට රාජකාරිමය වශයෙන් පහසුවකුත් සැලවී ඇති බව ඔවුන් දෙපක්ෂයට පැහැදිලිව තේරුම් ගෙන ඇත.

ගොවි සංවිධාන ක්‍රමය මගින් ගල්ඔය ගොවි ජනතාව තුල එම ශක්තිය වැඩි දියුණු කර ඇත. ඊට සමාන්තරව ඔවුන්ගේ සංවිධානාත්මක ශක්තිය හා අවබෝධය වර්ධනය වර්ධනය වී ඇත.

පැරණි ආකල්ප වෙනුවට අලුත් යහපත් ආකල්ප කරා ඔවුන්ගේ නැඹුරුවීමක් සිදුවී ඇත. කාර්යක්ෂම නිවැංදි නායකත්වයක් ක්‍රියාත්මක වීමට පසුබිම සකස් වී ඇත. නිලධාරින්ගේ පැත්තෙන් ගත්තද ගොවීන් තුල ගොඩ නැගෙමින් එන එම අලුත් ප්‍රමනතාවයන්ට අනුකූල වන අන්දමින් අලුත් ආකල්ප ලියලා එමින් පවතී.

සුහදතාවය. හා සාකච්ඡා මාර්ග පදනම් කරගත් මේ පසුබිම් යටතේ ප්‍රතිලාභ පැත්තෙනුත් පහසුකම් පැත්තෙනුත් දෙපක්ෂයටම වඩාත් හිතකර තත්ත්වයක් උදවී ඇත. තිබුනදෙයක් අතහැර අලුත් දෙයක් කරා කෙනෙකු යොමු වන්නේ අලුත් දෙය වඩාත් වාසි සහගත බව පෙනී ගියහොත් පමණි. එමෙන්ම තිබුන පැරණි ක්‍රමයට වඩා නොතිබුන අලුත් ක්‍රමය යඩාත් ප්‍රතිඵලදායි බව ගොවීන්ට මෙන්ම නිලධාරින්ටද ඒත්තු ගොස් ඇත. ගල්ඔය ගොවි සංවිධාන ව්‍යාපාරයේ සේවය කරන ගොවි සංවිධායකයින් සහ ගොවි සංවිධායකයන් විසින් ඉටු කරන ලද කාර්ය භාරය තුළින් මේ ගොවි නිලධාරි සම්බන්ධිකරණය සාර්ථක වී ඇති බව මෙහිදී නොකියා නොහැකිය. මෙහිදී සිදුවී ඇත්තේ නොතිබුනු දෙයක් අලුතින්ම නිර්මාණය කිරීම මිස, තිබුන දෙයකට පුණර්ජීවයක් දීම නොවේ. පර්යේෂණ වැඩ සටහනක් වශයෙන් ආරම්භ කරන ලද ගල්ඔය ගොවි සංවිධාන ව්‍යාපාතිය ගොවීන්ගේ ගැටලු ලියාදෙමින් ගොවීන් හා නිලධාරීන් අතර සම්බන්ධිකරණය වඩ වඩා තහවුරු කරමින්, දිනෙන් දිනම ජනප්‍රිය වන බව පෙනී යයි.